මුහුණට සවි කර ඇති ඔක්සිජන් ආවරණයෙන් වැසී ඇති බැවින් නිරාශාට ඔහුගේ මුහුණ නිසි ලෙස නොපෙනෙයි. යන්ත්‍ර සූත්‍ර වල සිහින් හඬ හැරෙන්නට ඔහු හුස්ම ගන්නා හඬක් පවා ඇය නෑසුණි. ඔහුගේ හිස වෙලා ඇති වෙළුම් පටි මත සියුම් ලේ පැල්ලමක් මතු වී ඇති සැටි ඇයට පෙනුණි.

වරෙක කුඩා දරුවකු සේ තමාගේ හිස කෙස් අවුල් කර දමා සිනාසුණේ ඔහු ය.

"මගේ චිත්‍රපටියෙ ඔයාට රඟපාන්නට රෝල් එකක් නැහැ නී" යි කියා තමාගේ හිත කඩා දැම්මේද ඔහු ය. එනමුදු ඔහු අතහැර දා යා නොහැකිය. විදුල යනු තමාගේ ජීවිතයම නොවේදැයි ඒ මොහොතේ නිරාශාට සිතුණි. ඔහු හැර යන්නට තීරණය කිරීමේ වරද පිළිබඳ පසුතැවීමක් ඇගේ සිතේ මතුව ආවේය. තමාගේ තීරණය නිසා ඔහු දුක්වන්නට ඇත. මතුපිටින් නොපෙන්නුවද එය ඔහුට දරුණු වේදනාවක් ගෙන දෙන්නට ඇත. මේ ඉරණමට මුහුණ දෙන අතරේදීත් ඒ වේදනාව ඔහුගේ සිතේ තිබෙන්නට ඇත. තමා අතින් සිදුවූයේ බරපතල වරදක් යයි නිරාශාට සිතෙයි. ඔහුගෙන් ඒ පිළිබඳ සමාව ගන්නට හැකියාවක් ලැබේද? සමාව නොදීම ඔහු යන්නටම යයිද?

000000

මුලුතැන් ගෙය එකම පිස්සන් කොටුවකි. නිසි ලෙස පිරිසිදු නොකළ භාජන රැසක් තැන තැන ගොඩ ගසා තිබුණ ද ඒ කිසිවක් කෙරෙහි සිත නොයෙදවූ නිරාශා තේ කෝප්ප දෙකක් සෑදුවාය. ඇඳ මත වාඩි වී දෙකකුල් පොරෝනයකින් වසාගෙන බිත්තියට පිට දී සිටි මදාරා අතට එක් තේ කෝප්පයක් දුන් නිරාශා ඇයට මුහුණ ලා වාඩි වූවාය.

"එළිවෙන්නත් ළඟයි.." නිරාශා කීවාය.

කාලය පිළිබඳ කිසිදු හැඟීමක් මදාරාගේ සිතේ නොවුණි. පැයක් හෝ දෙකක් පමණ තමා නිරාශා හා කතා කරමින් සිටින්නට ඇතැයි ඇය අනුමාණ කළාය. මේ කාලය තුළ ඈ බොහෝ දිග කතාවක් නිරාශා හමුවේ දිග හරිමින් සිටියාය. ඇගේ මුවින් පිටවූ සෑම වදනක්ම නිරාශා අසා සිටියේ විමතියෙනි. කුතුහලයෙනි. අවධානයෙනි. විදුල හා තමා අතර සබඳතාව බිඳ දමන්නට මුල් වූ ඒ අපූරු තිරනාටකයේ කතා නායිකාව ඇගේ වදනින්ම හෙළි කරමින් තිබූ කටුක ජීවිත කතාව අසා අවසන නිරාශා දිග සුසුමක් හෙළුවාය.

"අපරාදෙ මං විදුල එක්ක ප්‍රශ්නයක් හදා ගත්තෙ .." ඒ සුසුමින් අනතුරුව ඈ කීවාය. ".. දැන් මට තේරුම්ගන්න පුලුවන් මේ චරිතයට එයා මාව තෝරගත්තෙ නැත්තෙ ඇයි කියලා.. එයාගෙ හිතේ ඇඳිලා තියෙන්න ඇත්තෙ ඔයාගෙ වගේ රූපයක්.."

"සර් කවදාවත් ඔය වගේ කාරණයක් ගැන මා එකක් කතා කරලා තිබුණෙ නැහැ.. කොහොමත් සර්ගෙ පුද්ගලික ජීවිතේ ගැන අපි කතා කරලම නැහැ.. ඒත් මං දැනගෙන හිටියා සර් මොකක් හරි ප්‍රශ්නයක ඉන්න බව.. මට දැනුණා.. මං හිතුවෙ ෆිල්ම් එකට ප්‍රොඩියුසර් කෙනෙක් හොයා ගන්න බැරි වුණ නිසා සර් කළකිරිලා හිටියා කියලයි.. ඒත් ඔය දෙන්න ඈත්වෙලා යන තරම් ලොකු ප්‍රශ්නයක ඉන්න බවක් මට තේරුණේ නැහැ.." මදාරා කීවාය.

"ඒ එයාගෙ හැටි.. එයා කවදාවත් එයාගෙ පුද්ගලිකත්වය ඉස්සරහට දාගෙන වැඩ කළේ නැහැ.. මාව ෆිල්ම් ඒකට ගන්න ඕනෙ කියන සිතුවිල්ලක්වත් එයාගෙ හිතේ නොතිබුණේ ඒ නිසයි.." නිරාශා යළි සුසුමක් හෙළුවාය. වියැළී තිබූ දැස් යළි කඳුළින් තෙත් වනු ඇයට දැනුණි.

උදා හිරු එළිය ජනෙල් වීදුරු තුළින් කාමරයට වැටෙමින් තිබෙයි. උදාවෙමින් තිබෙන්නේ අලුත් දවසකි. අදින් පසු සියල්ල වෙනස් වන බව නිරාශාගේ සිත කියයි. ඊයේ දවස විසින් ජීවිතයේ තීරණාත්මක වෙනසක් කරනු ලැබ ඇති බව සක් සුදක් සේ පැහැදිලිය. ඊයේ දවස විසින් සළකුණු කරනු ලැබුවේ ජීවිතයේ එක් පරිච්ඡේදයක අවසානයයි. අද මේ උදා හිරු එළියත් සමගින් ඊළඟ පරිච්ඡේදය ආරම්භ කළ යුතුව ඇත. එය කෙසේ වනු ඇද්ද යන්න සිතා ගත නොහැකි වුවත් තමන් ඉදිරියේ ඇත්තේ කටුක ගමනක් බව නම් නිරාශාට වැටහෙයි. දැන් එයට මුහුණ දෙන්නට සූදානම් විය යුතුය. සෑම අවසානයක්ම නව ආරම්භයක තිඹිරි ගෙයයි.

0000000000000

"සම්මානණීය සිනමා අධ්‍යක්ෂ විදුල මුණසිංහට මැර ප්‍රහාරයක්" මේසය මත තබා ඇති උදෑසන පුවත්පත් අතර උඩින්ම තිබූ පුවත්පතේ ප්‍රධාන ශීර්ෂ පාඨය හසන්තට පෙනෙයි. "ඔහුගේ තත්වය බරපතළයි.. අපරාධකරුවන් අල්ලනවා - පොලිසිය කියයි" උප ශීර්ෂපාඨයෙන් කියැවෙයි.

හසන්ත පුවත්පත් කීපය අතට ගෙන ශීර්ෂ පාඨ පමණක් කියවාගෙන ගියේය. විදුලට එල්ල වූ මැර ප්‍රහාරය සාර්ථක ලෙස අලෙවි වෙමින් තිබෙයි. සෑම පුවත්පතකම ඇත්තේ එක හා සමාන වාර්තා ය. මැර ප්‍රහාරය එල්ල වෙද්දී ගත් සේයා රූ කීපයක්ම පළ කරන්නටද පුවත්පත් කීපයක් සමත් වී තබුණි. ඒ සේයා රූ තුළ තමා දන්න හඳුණන මුහුණු ඇද්දැයි හසන්ත උවමනාවෙන් බැලුවේය.

ඊයේ හසන්ත දේශණ ශාලාවට එනවිට දේශණය ඇරඹී පැය බාගයක් පමණ ගතවී තිබුණි. දේශණ ශාලාවේ ඉදිරිපිට පාරේ මදක් ඈතින් නවතා තිබූ කලු පැහැති වීදුරු සවිකළ රථය ඔහුට තවමත් මතකය. එයට පිට දී ගෙන සිටි කලු කන්නාඩි පැළඳි මිනිසාද මතක සිටියේ මන්දැයි ඔහු නොදනියි. ඒ පුද්ගලයා මෙතැනට නොගැළපෙන්නේ යයි ඒ මොහොතේම හසන්තට සිතුණි. සමහර විට රහස් පොලිසියෙන් හෝ වෙනත් ආරක්ෂක අංශයකින් විය හැකිය.

ශාලාවට ඇතුල් වන විට විදුල සිටියේ කතාව හමාර කරමින්ය. සිනමාව පිළිබඳ දේශනයක් අසන්නට පැමිණි පළමු අවස්ථාව බැවින් යම්කිසි නුහුරු බවක්ද ඔහුට දැනුණි. ප්‍රශ්න ඇසීමේ අවස්ථාවේදී කීප තැනකින් නැගුණ විරෝධය යම් කිසිවකු විසින් මෙහෙයවනු ලැබූ බවද ඔහුට වැටහුණි. ඒ විරෝධය ගාලගෝට්ටියක් බවට පෙරළෙද්දී වේදිකාව මතට පැනගත්තේ විරෝධතාකරුවන් නොවන බවද හසන්ත නිරීක්ෂණය කර තිබුණි. පැහැදිලි ලෙසම එහි කණ්ඩායම් දෙකක් විය. ඒ කවුරුන් විය හැකිද? කිසියම් කණ්ඩායමක් අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් බව නම් පැහැදිලිය.





බුද්ධිමතුන් සහ විරෝධාකල්ප ඇති කලාකරුවන් මුහුණ දෙමින් සිටින අනාරක්ෂිත බව පිළිබඳ පළමු වැටහීම හසන්ත ලබාගනිමින් සිටියේය. ඔහුට මේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ යම් වැටහීමක් තිබුණ නමුත් එය මේ සා දරුණු ලෙස ක්‍රියාත්මක වන්නේය යන්න ඔහු අත්දැක්කේ පළමු වතාවටය. එහි කම්පනය තවමත් ඔහුට දැනෙයි.

හසන්ත දුරකතනය අතට ගත්තේය. ඔහු එබුවේ තමාගේ හිතවතකු වන පොලිසියේ ඉහළ නිළධාරියකුගේ අංකයයි.

"විදුලගෙ කේස් එක ගැන මොකක් හරි කෙරෙනවද මචං.." ඔහු වැල්වටාරමින් තොරව කෙළින්ම ඇසුවේය.

අනෙක් කෙළවරින් පිළිතුරක් ආවේ මඳ පමාවකින් පසුවය.

"මොකක් හරි කෙරෙයි.. ඒත් මේවට අත දාන්න එපා බං.."

**මතු සම්බන්ධයි**




# What's more important?

Money has a limit
And will run out when you reach it
Fame is only temporary
And what about if you don't have any
Being intelligent will help you go a mile
But would it truly make you smile
When everything is gone
And you are left alone
It is the people that have been there from the start
That plays the biggest part

A mother's advice to her child was to always treasure what was most important to him because that would be what would make him happy, the little boy who had so much to yet discover was unsure about what was most important to him. Was it the money that his father went to work for everyday? Was it to become intelligent after studying hard at school? Or was it to always be best at everything so that you are known around the world? Seeing the confusion in her sons face his mother suggested an idea. "Why don't we imagine what life would be like for a person if they were rich, famous or smart and see if that is the most important thing in life."

Just imagine someone living in a large house with everything that you could ever want. A room full of gold and money. The son thought about this for a moment and came to the decision that money is the most important thing in life. "I would be able to buy anything that I want and surely that would make me happy." The mother asked the son "But who would you share all your riches with? What would happen when all your money runs out? You would be only left with the things you buy. Once you get bored with them and they break then what would you have left?" The little boy thought about this and came to the decision that money was not the most important thing in life.

"What about being smart mother, intelligence lasts a lifetime and never runs out." Someone intelligent would be able to solve anything, he would be able to go out into the world and achieve many things. "Mother I think intelligence is defiantly the most important thing because I would know everything." The boy's mother considered her sons answer "Intelligence is a virtue but would knowing more make you happier? It is true that you need to be smart to survive in this world, but son you should know that surviving is different from living." Again the son changed his mind "mother now I realise that being smarter is not the most important thing in life because it does not make you happier, but then what does?"

"I know what it is now mother, it's being famous isn't it? Fame will always be there and will definitely make you happy." As the little boys final choice he picks fame as the most important thing in life. Again the boy's mother shook her head and disagreed with her son. "A person could be adored by the world, sing on the biggest stages or win the most prestigious awards but at the end of the day when they are alone at home and there is no flashing cameras, what would be there for them? Fame is something that you have when you are in the public eye but when you inside your house walls all that does not matter, you would be alone." Defeated again the little boy agreed that fame was not the most important in life because it would not always be with you.

The boy gave up and asked his mother for her advice "Mother what is most important for you? I know it's is not money because you are scared that it will run out, it's definitely not being extremely smart because knowing more would not make you happier and it's not fame because it would not always be there for you." The little boy was not able to think about what his mother treasured the most.

"Son you have asked for everything that you do not have, things that people wish for every day, but what is most important to me in life is sitting right next to me. My family is my life treasure and they are there with me from the day I was born. Why son family never finishes as easily as money does why family lasts you your whole life. Your loved ones make you happy; they always put a smile on your face when you are sad. Finally family will always be there for you when you are alone you can go to them. Son the love that you receive from you family, that is the most important thing in life, never take that for granted. The little boy who had never realised how much joy his family had brought him made up his mind, "mother now I know what the most important thing in life is , it's coming home every day to you outstretched arms because I know that no matter what you will always be here for me."